


## පමා නොවී එමි අකුරට

# බිත්තර පාං නො-කා-පාං

මා කොළඹ ආනන්ද විද්‍යාලයේ උසස් පෙළ හදාරද්දී ලැබූ අත්දැකීම් මත පදනම් වූ මේ කොලම "පමා නොවී එමි අකුරට" යනුවෙන් නම් කෙරුනේ ආනන්ද යේ ආදර්ශ පාඨය වන "අප්පමාදෝ අමත පදං" යන පාලි පාඨයේ අදහසට කදිමට සමානුපාත වන සිංහල උපදේශතාත්මක කවියකින් උපුටාගත් පදවැලක් ඇසුරිණි.

පරකන්දෙනිය නම් වූ මගේ උපන් ගම පිහිටියේ කොළඹින් සැතපුම් පහලොවක් පමණ නුදුරින් වුව ද, පමා නොවී අතුරට යන්නට නම් අපට උදේ රැයින් ම අවදි වෙන්නට සිදුවිය. පාසල් යන දිනවල පාන්දර පහට පමණ තාත්තා පැමිණ මල්ලීත්, මාත් නිදගත් නිවසේ ප්‍රධාන කොටසින් වෙන්ව පිහිටා ඇති ඉස්තෝප්පු කාමරයේ දෙරට තට්ටු කරයි. මම පහයි කාලට පමණ වදෙන් පොරෙන් ඇඳෙන් නැගිට කුස්සියට යමි. උදේ බස් රථය අපේ නැවතුමට ලඟාවෙන්නේ තවත් පැය භාගයකින් පමණය. මා මුලින්ම කරන්නේ, අම්මා උණුවතුර බෝතලයට දමා ඇති කහට වතුර ටිකක් කෝප්පයක දමා, සීනි හා කිරි පිටි සමග මුසුකර තේ කෝප්පයක් සාදා බීමයි.

**ශත විසිපහකට අලෙවි වූ අඟල් තුනක පමණ විශ්කම්භයක් ඇති වෘත්තාකාර ලූණු පාං ගෙඩිය ඉන් මිළෙන් අඩුම ආහාරය විය. ඊළඟට තිබුනේ, තුන් හුලස් හැඩයෙන් යුතු, අල සහ ලූණු මිශ්‍රණයක් සහිත එකකි. එහි මිල ශත තිස් පහක් විය. කෙසේ වෙතත් මා සිත ගත්තේ නම්, අඟල් හයක පමණ දිග සබ්මැරිනයක හැඩ ගත් බිත්තර පාං ගෙඩිය විය. එය මැදින් පලා තැම්බූ බිත්තර තීරු දෙකක් ද, තක්කාලී තීරුවක් ද, අමු මිරිස් කැබලි දෙකක් ද යොදා ගනිමින් වෛවර්ණව සරසා තිබුණි. දුටු සැනින් රස නහර උත්තේජනය වී කටට කෙල උනා එයි. එහි මිල ශත පනහක් විය.**

ඊලඟට හනසු අඟුරු ස්වල්පයක් ගෙන ඇඟිල්ලෙන් දත් මදින මම, වහ වහා මුහුණ, අත, පය සෝදමි. බඹ එකලොහක් ගැඹුරු ලිඳක් මිස නාන කාමර හෝ විදුලියවත් නොතිබුණු නිවසක වාසය කල අපට, සතියේ දිනවල උදේට ඇඟ සේදීමට අවකාශ නොමැත. ඇඳ පැලඳ ගත් පසු මම උදේ ආහාරය ගනිමි. එය බොහෝ විට රොටියකි, නැතිනම් ඉදිආප්ප ය. බොහෝ දිනවල මේ වෙලාව වනවිට පාරේ ඈතින් බස් රථය එන හඬ ඇසෙයි. සීනි ස්වල්පයක් මැදට දමා දෙකට නවා ගත් රොටිය කන ගමන් ම, මම ගුරු පාර දිගේ මීටර් පන්සීයක් පමණ දුරින් පිහිටි මහ පාරට දිව යමි.

සැතපුම් දෙකක් පමණ දුරින් පිහිටි ගණේමුල්ලට යෑමට බස් රථයට බොහෝ විට ගත වෙන්නේ විනාඩි දහයක් වැනි සුළු කාලයකි. එතැන සිට දුම්රියෙන් මරදනට යා යුතුය. ආනන්ද විද්‍යාලය පිහිටියේ දුම්රිය ස්ථානයේ සිට කිලෝ මීටරයක පමණ දුරිනි. උදෑසන හතට පෙර මා පාසලේ ය.

හවස පාසල නිමවීමෙන් පසු මුල්ම දුම්රියෙන් මරදනෙන් පිටත් වෙන මා, හවස 2:35 ට ගනේමුල්ලට පැමිණිය ද, අපේ පාරේ දුවන්නේ එකම එක බස් රථයක් නිසා එය එනතුරු සිට, විනාඩි දහයක ගමණින් පසු නිවසට ලඟාවෙන විට 3:40 පමණ වෙයි. මා කෙලින්ම දිව යන්නේ අම්මා බෙදූ කෑම මේසය මත තබා ඇති බත් පිඟානට බව අමුතුවෙන් කිව යුතු නැත.

උදේ රොටිය කමින් දුවන වේලාවේ සිට හවස බත් පිඟානට වග කියන වේලාව දක්වා පැය දහයක කාලය අතර තුර මගේ කුස පුරවා ගැනීම සඳහා අම්මා සමහර විට තවත් කුඩා රොටියක් ඔතා දෙයි. එසේ නොමැති වූ දිනවල මගේ පිහිට ට ඇත්තේ පාසල් කැන්ටිමයි.

පාසලේ ඉන්නා ළමුන් සංඛ්‍යාවට සාපේක්ෂව බලන විට ආනන්දයේ කැන්ටිම ඉතා කුඩා එකක් විය. මෙනිසාම, විවේක කාලයේ එය නිරතුරු පිරී ඉතිරී තිබුණි. කැන්ටිමට යන පාසල් ළමුන් අතර තේ බොන්නෝ හිඟය.

පෝටෙලෝ, ෂැරෝනා, පැෂෝනා වැනි බීම තිබුනද (ෆැන්ටා, කොකා-කෝලා යුගය එලැඹියේ මින් පසු කාලයක දී බව තරුණ පාඨකයෝ සළකත්වා!), ඒවායේ මිළ ගණන් පොදු වශයෙන් ශිෂ්‍යයින් ගේ ක්‍රය ශක්තියෙන් ඔබ්බේ විය. වැඩි පිරිස කරන්නේ මොනවා හෝ කඩචෝරුවක් කෑමයි. ඉන්පසු වතුර පයිප්පයකට කට අල්ලා බඩේ ඉතිරි ටික පුරවා ගත හැක.

කෑම සඳහා කැන්ටිමේ මාළු පාං වර්ග තුනක් විය. ශත විසිපහකට අලෙවි වූ අඟල් තුනක පමණ විශ්කම්භයක් ඇති වෘත්තාකාර ලූණු පාං ගෙඩිය ඉන් මිළෙන් අඩුම ආහාරය විය. ඊළඟට තිබුනේ, තුන් හුලස් හැඩයෙන් යුතු, අල සහ ලූණු මිශ්‍රණයක් සහිත එකකි. එහි මිල ශත තිස් පහක් විය. කෙසේ වෙතත් මා සිත ගත්තේ නම්, අඟල් හයක පමණ දිග සබ්මැරිනයක හැඩ ගත් බිත්තර පාං ගෙඩිය විය. එය මැදින් පලා තැම්බූ බිත්තර තීරු දෙකක් ද, තක්කාලී තීරුවක් ද, අමු මිරිස් කැබලි දෙකක් ද යොදා ගනිමින් වෛවර්ණව සරසා තිබුණි. දුටු සැනින් රස නහර උත්තේජනය වී කටට කෙල උනා එයි. එහි මිල ශත පනහක් විය.

බිත්තර පාං වලට ඇති දැඩි කැමැත්ත කෙසේ වුව ද, ආනන්දයට ගිය සිව් වසර තුලදීම, මම කිසි දිනක ශත ශත පනහක් දී බිත්තර පාං ගෙඩියක් මිලදී නොගත්තෙමි. මුදල් අතේ තිබූ දිනවල වුවද, එක්කෝ ශත විසිපහේ ලූණු පාං එකක් හෝ ශත තිස්පහේ එලවළු පාං එකක් මිස, බිත්තර පාං කන්නට මට සිත් වූයේ ම නැත. බිත්තර-පාං, නො-කා-පාං ම විය.

සතියට දින දෙකක් පමණ විවේක කාලයට පෙර කාල පරිච්ඡේදයේ අපට නියමිත විෂයය වූයේ ඉංගිරිසියයි. අපට ඉංගිරිසි ඉගැන්වූ දසනායක ටීචර් ගේ පුතා උගත්තේ දහවැනි ශ්‍රේණියේම වෙනත් පන්තියක ය. විවේක කාලය සඳහා සීනුව හැඬ වූ විගසම, ඔහු තම මව සොයා එයි. අම්මා සිය පසුම්බියෙන් ගෙන යම් මුදලක් පුතුට දෙයි. පසුව කැන්ටිමට ගියහොත් දක්නට ලැබෙන්නේ ශත පනහේ බිත්තර පාං ගෙඩියක් රස කරමින් කමින්, ෂැරෝනා හෝ පැෂෝනා බෝතලයක් බොන දසනායක සිසුවාය. මම සුපුරුදු පරිදි ශත තිස්පහේ මාළු පාං එකක් රැගෙන එය කා දමා වතුර පයිප්පයෙන් බඩ පුරවා ගනිමි.

මේ කතාව සඳහා වසර තිහකට වඩා පැරණි මගේ මතකය අළුත් කරද්දී මට වැටහී ගියේ එදා ඇත්තටම බිත්තර පාං පිලිබඳව මගේ සිතේ තිබී ඇත්තේ මේ කාලයෙන් වසර තුන හතරකට පසු සුනිල් ආරියරත්න විසින් ලියන ලදුව නන්දා මාලිනී ගැයූ අර "නෙලාගන්න බෑ, මගේ අත දිග නෑ, ඒත් අනේ තව මල් පිපියං! කෝටි ගනං තව මල් පිපියං!!" ගීතයෙන් ගම්‍ය වන ආකාරයේ සංකීර්ණ චින්තනයක් බවයි.

දුඹුරු, රතු, සුදු, කහ, කොල වර්ණාවලියෙන් අලංකාර වූ බිත්තර පාං දැක සතුටු වූවද, ඒවා රස විඳීම සඳහා අවශ්‍ය අමතර මුදල් ප්‍රමාණය වැය කිරීමට මම කෙදිනක හෝ නොසිතුවෙමි. "අනුං ඇවිත් මල් නෙළුවාවේ! එමල් දකින පින ලැබුනාවේ!!"

ඒ බිත්තර පාං වල රසය අදත් මම සිතෙන් පමණක් විඳින්නෙමි.

පසු සටහන

මීට වසර කිහිපයකට පසු පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ පැවති නන්දා මාලිනී ගේ ගීත පිළිබඳ සම්මන්ත්‍රණයක දී මහාචාර්ය සුචරිත ගම්ලත් පවසා සිටියේ, "නෙලාගන්න බෑ" ගීතය, ධනපති පැළැන්තියට උඩ ගෙඩි දෙන, ධනවාදී ක්‍රමය සාධාරණීකරණය කරන, ප්‍රතිගාමී, සමාජ විරෝධී අදහසක් දෙන්නක් බවයි. ආර්ථික යේ ඵල සැම දෙනාටම එක සේ අයත් විය යුතු බවටත්, සමහරුන් ට ඒ සඳහා අත දිග නැත්තේ සමාජ ක්‍රමයේ වැරදි නිසා බවත්, සත්‍යය එසේ වෙද්දී නිර්ධන පන්තියට ඉච්ඡා භංගත්වය ඇති කරවන මෙවැනි ගීත ලිවීම සමාජ විරෝධී වන බවටත් ඔහු තර්ක කළේය.

ඉහත සඳහන් නන්දා මාලිනී ගේ ගීතයේ සම්පූර්ණ පදමාලාව මෙන්න.

නෙලාගන්න බෑ, මගේ අත දිග නෑ,
අනේ ඒත් තව මල් පිපියං!
කෝටි ගනං තව මල් පිපියං!
මට විතරද මල් පිපෙන්නෙ?
මං විතරද මල් කඩන්නෙ?
අනුන් ඇවිත් මල් නෙළුවාවේ!
මලේ සුවඳ මට දැනුනාවේ!
අතින් නෙලන මල් පිපෙන්නෙ,
පෙර පිනටයි මට හිතෙන්නෙ
මුළු ලොවටම මල් පිපුනාවේ!
එ මල් දකින ඇස් ලැබුණාවේ

රසික සූර්යආරච්චි

4 වන පිටුවට (ජනාධිපතිතුමාට තවත්)

නොහොත් පාලකයකුට කළ හැකි, බාර දිය හැකි රාජකාරියක් නොවේ. සිංහල වියතුන් විසින් උර දිය යුතු ජාතික වගකීමකි. රජයකට කළ හැක්කේ ඔවුන් දියත් කරන වැඩ පිලිවෙළකට අවශ්‍යය නීතිමය වාතාවරණය සහ පහසුකම් සපයාදීමය .

සරසවි ඇදුරන්ට සිංහල ඉගැන්වීම යෝජනා කරන්නට මම අකමැත්තෙමි. එහෙත් මට හරියට සිංහල ලියන්නට ඉගැන් වූ ගමේ පාසලේ සිංහල ගුරුවරයා වාගේ නිහඬ මෙහෙයක් ඉටු කරන ගුරුවරුන් මෙහිලා උනන්දු කරවීම පළමු පියවර වශයෙන් සඳහන් කරමි. එතැනින් පටන් ගෙන ගුරු විදුහල් ආදී ආයතන කෙරෙහි ද යොමු වීම හිතකර ය. පුවත්ත් කලාව පුහුණු කරන ආයතන ද වැදගත් සේවයක් ඉටුකිරීමට සමත් වනු ඇත.

මේ සියල්ලම කරන්නට පෙරාතුව, සියළුම සිංහල වියතුන් නියෝජනය කරන පිරිසක් විසින් බස නොනසා දියුණු කරනු වස් රැක ගත යුතු මූලික අවශ්‍යතා, ශික්ෂණය නොහොත් වියරණය කෙබඳු විය යුතුදැයි එකඟතාවක්, සම්මුතියක් ඇති කර ගැනීමත්, ඒ සම්මුතිය රටටම පැහැදිලි කර දීමත් අවශ්‍ය බව කියමි.

මා මේ කරන්නේ දුර තියා ඇසෙන තැනකට ඇසෙන්නට, හූවක් තැබීමක් බවත් මම දනිමි.

